# අනන්තය

ආචාර්ය
වික්‍රමබාහු
කරුණාරත්න



# මහින්ද රජානන්ගේ යුද්දයේ හරය

**මේ ආණ්ඩුව ජාතිවාදී අධිරාජ්‍ය ගැති ධනපති ආණ්ඩුවක්. ඇමරිකාවේ, ඉන්දියාවේ ඇඟිල්ලෙන් නැටවෙන ධනපති ආණ්ඩුවක්. ගෝලීය ධනපති උවමනාව උඩයි සියළු ආර්ථික ක්‍රියාවලියන් සකස් වෙලා තියෙන්නේ. ඇත්ත වශයෙන් මේ යුදවාදය තුළින් රාජ්‍ය බලය ඉතාම දරුණු විදියට ශක්තිමත් කරගෙන තියෙන්නේ වෙන මොකකටවත් නෙවෙයි, සේවකයින්ව යට කෙරගෙන සූරාගෙන කන්න. ලෝකය පුරාම යුද්ධානුභාවය පතුරවලා ධනපති පංතිය කරන්නේ රාජ්‍ය යන්ත්‍රය ධනපති සූරාකෑම තහවුරු කර ගැනීම වෙනුවෙන් පෙළ ගස්වා ගැනීමයි.**

විසාල නය කන්ද්‍රාවකට මෙරට උකස් කරල මහින්ද රජු වඩාත් දරුණු විදියට ගෝලීය දනවාදය සමඟ ගමන් ආරම්බ කරල. ඇත්තට ම දැන් එක්සත් ජාතික පක්සය ට ඉදිරිපත් කරන්න විකල්ප වැඩ පිලිවෙලක් නෑ. රටේ හොඳම දනපති පක්සය සිරි ලංකා නිදහස් පක්සය බවට පත් වෙලා. එයට දැන් දෙමල මුස්ලිම් ආදී දනපති කොටසුත් එකතු වෙනවා. ඔවුන් කොටි කැරුල්ලට විරුද්ද දනපතියො. ඔවුන් ඉතාම නිවැරදිව තේරුම් අරන් තියෙනව කොටි කියන්නේ පහල ජනතාව කියල. ඒ පහල කොටස් ජාතිය කියාගෙන නැගිට්ටත් එන්නේ තමන්ට විරුද්දව කියල ඔවුන් වටහාගෙන ඉන්නේ. ඒ අනුව දෙමල දනපති කොටස් යටි හිතින් මේ ඇති වුන රුදුරු ගාතනයට කැමතියි. ඒ මැරුනේ පහල පීඩිත ජනතාව. වෙසෙසින්ම පහල කියන කුල වල ජනතාව. ඒ අය මරා දමා විනාස කිරීම තමා යුද්ධයේ මූලික අරමුන. ඒ මගින් ඉඩම් හා සම්පත් දනපති දේපොල බවට පෙරලා ගැනීම.

ඒ අය දකින හැටියට මේ ඉඩම් වල වගා කරන්න ඉන්න දුප්පත් අය යැපුම් වගාව කරන අය. ඒ අනුව එම වගාවෙන් වැඩි අතිරික්තයක් ඇති වෙන්නේ නෑ. දියුනු තාක්සනය දාන්නත් බෑ. දියුනු නවීන තාක්සනය දමන්න නම් මේ ඉඩම් ඒකාබද්ධ කරල මහා ගොවිපලවල් බවට පෙරලගන්න ඕනා. නමුත් ඇත්තට ම මෙය අද තිබෙන නවීන සොයා ගැනීම් අනුව බොරුවක්. මොකද ඉඩම් වල රසය වැඩි කරගෙන වස විස අඩුකරගෙන මහ පල ප්‍රයෝජන අරගන්න පරිසර හිතකාමී තාක්සනය තියෙනව. ඒ නිසා ගැමි ගොවි විප්ලවයක් ඒ පරිසරවාදී චින්තනයෙන් හා සොයාගැනීම් තුලින් කරන්න පුළුවන්. එදා කොල විප්ලවය නැත්නම් හරිත විප්ලවය කියල කිව්වෙ ට්‍රැක්ටර්, හා රසායනික පෝර මහ ඉහලින් යොදා ගැන්මට. ට්‍රැක්ටර් බර අදින්න මිස වගාවට හිතකර නෑ කියන අදහසත් දැන් තියෙනව. කුඩා පරිමාන අත් යන්ත්‍ර ඊට වඩා සුදුසු පාරිසරික තාක්සනයක් වෙන්න පුලුවන්. මේ විදියට කුඩා ගොවීන්ම ඒකාබද්ද කරල ඇති කල හැකි නූතන ගැමි විප්ලවයක් ගැන අදහස් දැන් ඉවත දමන්න බෑ. එයත් සමාජවාදී විප්ලවයක් නෙමෙයි. දනපති විප්ලවයක්. හැබැයි සුලු නිස්පාදනය පදනම් කරගත්ත ජනතා විප්ලවයක්". ලෙනින් කියල තියෙනව ගැමි සමාජය දනපති ක්‍රමයට යටවෙන එක නවත්තන්න බෑ. හැබැයි කොයි පාරෙන්ද ගැමි සමාජය නූතන ලෝකයට එන්නේ කියන එක වැදගත් කියල. ඒ අනුව ගොවියා නූතන ලෝකයට ගැනීමට ඔහුගේ පැවැත්ම ශක්තිමත් කරන විප්ලවයක් ගැන හිතන්නම වෙනව. මෙය ගොවිතැනට ඒ වගේ කිරි ගොවිතැනටත් වැදගත් හැම ගෙදරකටම හරකෙක් දෙන්නෙක් දෙන එක හරක් ගාලවල් හදනවට වඩා වැදගත්. එවැනි දෙයින් තියෙන සම්පත් වලින් උපරීම ප්‍රයෝජන ගන්න පුළුවන්. ඒවා ජීව විද්‍යාවේ චක්කර අනුවම සංවර්දනයට යොදාගන්න පුළුවන්. විද්‍යාවෙන් සොයාගන්න දේවල් විප්ලවයට ගැලපෙන හා පොලවට ගැලපෙන විදියට යොදාගන්න පුළුවන්.

මාලුකාරයන්ගේ ගැටළුවත් මේ විදියටම සලකා බලන්න වෙනව. කුඩා බෝට්ටු කාරයාව ඉවතට තල්ලු කරලා මහා පරිමාන මාලුකාරයෝ නැව් පිටින් අරන් විප්ලවයක් කිරීම දැන් ඉතිහාසයට යට වෙලා ඉවරයි. ඒ වෙනුවට මාලු කාරයාට වඩා පරිසර හිතකාමීව, වඩා කල්පවතින පැවැත්මක් ගැන හිතන්න වෙනව. මුහුදයි, වෙරලයි රැකගෙන නූතන ලෝකයට එන්නේ කොහොමද කියලයි හිතන්න වෙන්නේ. මහ බෝට්ටු හා මහ දැල් එලුවා කියල විප්ලවයක් වෙන්නේ නෑ. විනාසයක් වෙන්න පුළුවන්. ඒ නිසා නූතන දනපති විප්ලවයක් ගැන ඒ පැත්තෙනුත් හිතන්න වෙනව. කුඩා මාලු කාරයාවම නූතන ලෝකයට ගැනීමට විප්ලවයක් අවසය වෙනව. ඒ සඳහා පරිසර හිතකාමී, මාලුකාරයන්ගේ විප්ලවකාරී බලයක් ගොඩනගන්න ඕනා. ඒ තුලින් දියුණු මාලු නිපදවීමක් ගැන හිතන්න වෙනව. උසස් නිපදවීම් සියල්ල මහා පරිමාන වෙන්න ඇවැසි නෑ. මහා පරිමාන දේවල් ඇවැසි අංස තියෙන්න පුළුවන්. ඒත් ඒක කෝකටත් තෙල නම් නොවේ.

අඩු දියුනු කම නැති කර ගන්න හා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ඇති කර ගන්නට අපිට ඉතාම සියුම් මාර්ගයක් තුලින් ඉදිරියට යන්න පුළුවන් කාලයක් මේ. ඉංදියාවේ මාක්ස්වාදී පක්සය ගෙඩි පිටින් බහු ජාතික සමාගම් ගෙන්න ගත්තහම දියුනු වෙනව කියල හිතල කරපු දේවල් වලින් විසාල පරාජයක් අත්කර ගත්ත. ඒ නිසා ජනතාවගේ ඉදිරි ගමන තමන් අත තිබෙන දැනුම, සරු බව හා සන්තෝසය අමතක කරල ගෙනියන්න බෑ. අනෙක් අතට වඩා දියනු තාක්සනයෙන් වඩා සැපය ලැබෙනව කියන කථාවත් මිත්‍යාවක්. ගතානුගතික වෙදකම් හා හෙදකම් නැතිකර ගැනීමත් මෝඩ වැඩක් කියල දැන් මුලු ලෝකෙම පිලි අරන් ඉවරයි.

